# තෝනිගල සෙල්ලිපියේ හෙළිවන ආර්ථිකය

චතුරිකා ඊෂාණි කුමාරසිංහ*

සෙල්ලිපි වූ කලී තත් කාලීන සමාජය විවරණය කරන පිළිබිඹුවකි. වෙසෙසින් තත් කාලීන සමාජ, ආර්ථික, දේශපාලන තොරතුරු අධ්‍යයනයේ දී සෙල්ලිපිවලින් ලබාගත හැකි දායකත්වය සුළුපටු නොවේ. ක්‍රි.ව හතරවැනි සියවස තරම් ඈත අවධියක දී ශ්‍රී ලංකා සමාජයේ පැවති ආර්ථික තතු පිළිබඳ තෝනිගල සෙල්ලිපිය ඇසුරින් සාකච්ඡා කිරීම මින් අපේක්ෂිතය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ඈත අවධියක පවතින ආර්ථිකය වර්තමාන ආර්ථිකයට කෙසේ ගැලපෙන්නේ දැයි සෙවීමයි. වවුනියාවේ සිට හොරොව්පතානට යන මාර්ගයෙහි 6 වෙනි සැතපුම් කණුවට උතුරින් පිහිටි දකුණු තිලක්කුමලේ පෙදෙසේ තෝනිගල නොහොත් නාරගල නමින් හැඳින්වෙන ගල් තලාවේ කොටා ඇති මෙම ලිපිය පේළි දාහතකින් යුක්තවේ. තෝනිගල සෙල්ලිපිය රචනා කර ඇත්තේ ශ්‍රී මේඝවර්ණ රජු රට එක්සේසත් කිරීමෙන් අනතුරුවය. රටක් ඒකඡත්‍ර හෙවත් එක් කුඩයක් යටට ගැනීමට නම් රටෙහි දේශපාලන මෙන්ම ආර්ථික සමෘද්ධියක් ද පැවතීම අත්‍යවශ්‍යය. තත්කාලීනව රට ආර්ථික වශයෙන් යම් සමෘද්ධියක් අත් කරගෙන තිබූ බවට යම් ඉඟියක් තෝනිගල සෙල්ලිපියෙන් ලැබේ. ශ්‍රී මේඝවර්ණ රජු දවස කළහුමනක නම් වෙළඳ නගරයක් තිබූ බවට මෙම සෙල්ලිපිය සාක්ෂි දරයි. ඇතැම් විට විවිධ ශිල්ප ශ්‍රේණි යටතේ නිෂ්පාදිත භාණ්ඩ අලෙවි කරන මධ්‍යස්ථානයක් ලෙස මෙම වෙළඳ නගරය පවත්වාගෙන යන්නට ඇත. කෘෂිකර්මාන්තය ඇසුරින් ධනධාන්‍ය හා වෙනත් භෝගවලට අමතරව කෘෂිකර්මාන්තයට අවැසි අවි ආයුධ පවා තත්කාලීනව නිපදවන්නට ඇත. යහිසපවය නම් විහාරයේ අරියවංශ උත්සවය සඳහා ලබාදෙන දීමනා අතර යාල, අමුණ වැනි කිරුම් මිනුම් යටතේ ලබා දුන් ධනධාන්‍ය පිළිබඳව සඳහන්වේ. සැබැවින්ම තියුණු ව්‍යාපාරික ඥානයක් සතු සමාජයක් මෙකල පැවති බව තහවුරු වන්නේ කිරුම් මිනුම්වල නිශ්චිතභාවයෙනි. ඒ නිසාම නිෂ්පාදනය, පරිභෝජනය, අතිරික්තය පිළිබඳ සැලකිලිමත් වෙමින් ධනධාන්‍ය පවා නිසි ලෙස කළමනාකරණය කර ගැනීමට හැකියාව ලැබිණි. වර්තමානයේ ක්‍රියාත්මකවන බැංකු ක්‍රමයට සමාන යම් තත්ත්වයක් එකල පැවතී ඇත. මිල මුදල්වලට අමතරව ඔවුන් ආයෝජනය කරන ලද්දේ ධනධාන්‍යය. ධනධාන්‍ය ගබඩා වැනි නිශ්චිත ක්‍රමවේදයකට තැන්පත් කර ඉන් ලැබෙන පොළියෙන් පමණක් විහාරයෙහි අවශ්‍යතා පිරිමසා ගැනීමට සලස්වන ලදී. මිල මුදල්වලට අමතරව කාලය, ජලය, ධනධාන්‍යාදි සියල්ලම නිසි කළමනාකරණය යටතේ සිදු වී ඇති බව තෝනිගල සෙල්ලිපිය ඇසුරින් වටහා ගැනීම අසීරු නොවේ. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍ර මගින් ශිලාලේඛන සංග්‍රහ ද ද්විතීයික මූලාශ්‍ර වශයෙන් මේ සම්බන්ධයෙන් වෙනත් කෘතීන් ද යොදා ගෙන ඇත. තෝනිගල සෙල්ලිපිය අධ්‍යයනය කරමින් එහි ආර්ථික තොරතුරු පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණවේ.

ප්‍රමුඛ පද :- අනුරාධපුර යුගය, සෙල්ලිපිය, ආර්ථිකය, කෘෂි භෝග, නිෂ්පාදනය.

* සිංහල අධ්‍යයනාංශය , කැලණිය විශ්වවිද්‍යාලය. goodluckeesh@gmail.com.